අධිකරණ, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා, පළාත් පාලන සහ කම්කරු අමාත්‍යාංශය
நீதி, பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள், உள்ளூராட்சி மற்றும் தொழில் அமைச்சு
Ministry of Justice, Public Administration, Home Affairs, Provincial Councils, Local Government and Labour

රාජ්‍ය පරිපාලන අංශය
பொது நிருவாகப் பிரிவு
Public Administration Division

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව.
சுதந்திர சதுக்கம், கொழும்பு 07, இலங்கை.
Independence Square, Colombo 07, Sri Lanka.

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No | PUBAD/SLAS/INTERVIEWS/<br>SPECIAL- I | ඔබේ අංකය<br>உமது இல<br>Your No | | දිනය<br>திகதி<br>Date | 2024.10.10 |

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියේ සහ II ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන නිවේදනයයි.

**<u>ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ</u>**

**<u>පාලක තනතුර සඳහා තොරතුරු තාක්ෂණ දැනුම සහිත නිලධාරීන් අනුයුක්ත කිරීම</u>**

ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවතින පාලක තනතුර සඳහා **තොරතුරු තාක්ෂණ දැනුම සහිත** පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියේ සහ II ශ්‍රේණියේ නිලධාරීන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

i. තොරතුරු තාක්ෂණ කළමනාකරණය විෂය ක්ෂේත්‍රයට අදාළව ප්‍රමාණවත් න්‍යායික දැනුම ලබා තිබීම සහ අවම වසරකට වඩා වැඩි එම ක්ෂේත්‍රයට අදාළ රාජකාරි පළපුරුද්ද සහිත නිලධාරීන් විය යුතුය. (ලේඛන හා සහතික මගින් සනාථකළ යුතුය.)

ii. ප්‍රියමනාප සේවා ස්ථානයන්හි සේවය කළ හැකි **උපරිම සේවා කාලය මෙතෙක් සම්පූර්ණ කර නොමැති** නිලධාරීන් විය යුතුය.

02. ඒ අනුව ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ පවතින ශ්‍රී ලංකා පරිපාලන සේවයේ තනතුර සඳහා අනුයුක්ත වීමට මනාපය පළ කරනු ලබන අයදුම්කරුවන් ස්වකීය මූලික සුදුසුකම් සහ අනෙකුත් තොරතුරු ඇතුළත්ව තමා විසින් සකස් කර ගත් ජීව දත්ත පත්‍රිකාවක්, ඒ සම්බන්ධයෙන් වන ලිඛිත ඉල්ලීමක් සමග අදාළ සහතික පත්‍රවල සහතික කරන ලද පිටපත් 2024.10.30 දින හෝ එම දිනට ප්‍රථම තම ආයතන ප්‍රධානියා මගින් රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස සහ එහි මෘදු පිටපතක් pubad.dslas@gmail.com යන විද්‍යුත් ලිපිනයට යොමු මෙන් කාරුණිකව දන්වමි.

03. තව ද, අයදුම්පත් යොමු කිරීමේදී, අයදුම්කරුවන් මෙම තනතුර සඳහා සුදුසකම් ලදහොත් දැනට සේවයේ නියුතු සේවා ස්ථානයෙන් අනුප්‍රාප්තිකයෙකු සහිතව /රහිතව/ පසුව ලබා දීමේ පදනම මත මුදා හැරිය හැකි බවට ස්වකීය අමාත්‍යාංශ ලේකම් හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියා සහතික කර අයදුම්පත ඉදිරිපත් කළ යුතු වන අතර අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට පසුව එවන අයදුම්පත් කිසිදු හේතුවක් මත භාර නොගන්නා බව ද වැඩිදුරටත් දන්වා සිටිමි.

එස්. ආලෝකබණ්ඩාර
ලේකම්
අධිකරණ, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා, පළාත් පාලන සහ කම්කරු අමාත්‍යාංශය
දුරකථන : 0112-698605 / ෆැක්ස් : 0112 – 683651
විද්‍යුත් ලිපිනය: pubad.dslas@gmail.com